# ජාතික අයවැය ලේඛනය
# පිළිබඳ
# තොරතුරු බිඳක්


අයවැය ඇස්තමේන්තුව

2009

1 වන වෙළුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
කොළඹ 01

# ජාතික අයවැය ලේඛනය

ඕනෑම පුද්ගලයෙක් හෝ ආයතනයක් සිය අවශ්‍යතා සපුරා ගැනීමේ දී තමා සතුව පවතින සම්පත් ප්‍රමාණය අනුව එකී අවශ්‍යතා කළමනාකරණය කරගත යුතු වේ. සම්පත් රැස් කිරීමේදීත්, ඒවා වියදම් කිරීමේදීත් මනා ශික්ෂණයක් අවශ්‍යය. එලෙසම, සැලසුම් කරනු ලබන ඉලක්ක කරා ආර්ථිකය මෙහෙයවීම සඳහා රජයට ද තමන්ගේ සීමිත සම්පත් කළමනාකරණය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එපමණක් නොව සිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීම ද රජයක් මගින් වාර්ෂිකව සිදු කරනු ලැබේ. ඒ සඳහා රජය මගින් යොදා ගනු ලබන මූලික ක්‍රමවේදය ජාතික අයවැය ලේඛනයයි.

රජයේ මූල්‍ය කටයුතු ලෙස ගැනෙන රජයේ ආදායම් රැස්කර ගැනීම, රජයේ වියදම් දැරීම, රජයට ණය ලබා ගැනීම හා ණය ආපසු ගෙවීම ආදී කරුණු පිළිබඳ තීරණ ගැනීමේ පරම අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පැවරී ඇත්තේ පාර්ලිමේන්තුවටය.

**රජය වෙනුවෙන් ජාතික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඒ අනුව විසර්ජන පනත් කෙටුම්පත් සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සහ වියදම් කළමනාකරණය කිරීම ඇතුළු ප්‍රමුඛ කාර්යභාරයන් රාශියක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.**

19 වන ශත වර්ෂය අවසානයේ සිටම වියදම් ඇස්තමේන්තු භාණ්ඩාගාරය විසින් සකස් කරනු ලැබීය. පාර්ලිමේන්තු සම්ප්‍රදාය යටතේ ප්‍රථම අයවැය ලේඛනය සෝල්බරි ව්‍යවස්ථාව යටතේ 1947 නොවැම්බර් 25 වෙනි දින ඇරඹී ප්‍රථම පාර්ලිමේන්තුව වෙත එම වසරේම දෙසැම්බර් 01 දා ඉදිරිපත් කෙරිණ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ එම ප්‍රථම අයවැය ලේඛනය ඉදිරිපත් කරනු ලැබුයේ එවකට මුදල් අමාත්‍යවරයා වූ ජේ.ආර්.ජයවර්ධන මහතා විසිනි. එදා පටන් 2009 වසර දක්වා අයවැය ලේඛන 62 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

➢ **ජාතික අයවැය ලේඛනය**

එය;

- ✓ රජයේ මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයකි.
- ✓ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන නිත්‍යානුකූල ලියවිල්ලකි.
- ✓ ඉදිරි වසරේ රජයේ ආදායම සහ වියදම කළමනාකරණය කරන ආකාරය දක්වන ප්‍රකාශනයකි.
- ✓ ආදායම් රැස් කිරීමටත්, වියදම් දැරීමටත්, අවශ්‍ය ණය ලබා ගැනීමටත් රජයට බලය ලබා දෙන්නකි.

➢ **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සැලසී ඇති අයවැය ලේඛනයේ නීතිමය පදනම**

- ✓ අංක 148 වගන්තිය - රාජ්‍ය මූල්‍ය බලය පාර්ලිමේන්තුව සතු බව.එනම්, රාජ්‍ය මූල්‍ය කටයුතු, (රජයේ ආදායම් රැස් කිරීම, රජයේ වියදම් දැරීම, රජයට ණය ලබා ගැනීම) රාජ්‍ය ණය සේවාකරණය (පොලී ගෙවීම් සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම්) ආදියෙහි පූර්ණ බලය පාර්ලිමේන්තුව සතු බව.
- ✓ අංක 149 වගන්තිය - ඒකාබද්ධ අරමුදලක් රජය විසින් පවත්වා ගෙන යන බව. ඊට සියළු ආදායම් සහ ලැබීම් රැස් කරන අතර, පාර්ලිමේන්තුව අනුමත කරන වියදම් එමගින් දරන බව.
- ✓ අංක 150 වගන්තිය - ඒකාබද්ධ අරමුදලින් මුදල් ඉවත් කර ගැනීම මුදල් අමාත්‍යවරයා විසින් වියදම් දැරීම සඳහා බලය ලබාදෙන අධිකාරී බලපත්‍රයකින් මිස සිදු කළ නොහැකි බව.

එසේ වුවද පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අවස්ථාවක අයවැය ලේඛනයක් මගින් මුදල් ප්‍රතිපාදන සලසා නොමැති නම් අංක 150(3)සහ(4) වගන්ති අනුව රාජ්‍ය වියදම් දැරීම සඳහා ඒකාබද්ධ අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමට ජනාධිපතිවරයාට බලතල ඇති බව.

➢ **පාර්ලිමේන්තුවට අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම සහ සම්මත කර ගැනීම**

- ✓ ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අයවැය සැකසීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම (අයවැය කැඳවීමේ චක්‍රලේඛය).
- ✓ රජයේ සියළුම ආයතනවලින් ඇස්තමේන්තු කෙටුම්පත් ගෙන්වා ගැනීම හා ඒවා සමාලෝචනය කරමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- ✓ එකී ඇස්තමේන්තු පදනම් කර ගෙන විසර්ජන පනත් කෙටුම්පත සකස් කිරීම.
- ✓ එය නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම සහ ඉන් අනතුරුව නීතිපතිවරයා වෙත ඉදිරිපත් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට සහතික කර ගැනීම.

✓ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට (පළමුවර කියවීමට) අවම වශයෙන් සතියකට පෙර එම කෙටුම්පත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම.

✓ විසර්ජන පනත් කෙටුම්පත නියමිත දිනයේ දී මුදල් අමාත්‍යවරයා හෝ අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරයෙකු විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම).

✓ පළමුවර කියවීමෙන් සති හතරකට පසුව, මුදල් අමාත්‍යවරයා විසින් අයවැය යෝජනා ඇතුළත් අයවැය කතාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (දෙවනවර කියවීම).

✓ පාර්ලිමේන්තුව විසින් සමස්ත අයවැය විවාදයට ගැනීම හා සම්මත කර ගැනීම(දෙවනවර කියවීමේ විවාදය).

✓ අයවැය තෙවනවර කියවීම හෙවත් කාරක සභා අවස්ථාව යටතේ සම්මත කර ගැනීම (මෙහිදී අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මට්ටමින් සියළු ඇස්තමේන්තු විවාදයට ගනු ලැබේ).

✓ අයවැය තෙවනවර කියවීමෙන් පසු කතානායකතුමාගේ අනුමැතිය ලැබීම (මෙම අනුමැතියත් සමඟ විසර්ජන කෙටුම්පත, පනතක් බවට පත්වේ).

✓ වියදම් දැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ අධිකාරි බලය ලබාගැනීම.

➢ ජාතික අයවැයක් යනු රටේ දිගු ගමනක එක් වාර්ෂික සැලැස්මක් පමණි. වර්තමානයේ දී අයවැය ඇස්තමේන්තු, අදාල වර්ෂය සහ ඊළඟ ඉදිරි වසර දෙකෙහි සැලසුම් ද පදනම් කරගත් එනම්, මැදිකාලීන වියදම් අපේක්ෂාවන් ද ඇතුළත්ව පිළියෙල කරනු ලැබේ. මෙය මෑත කාලීනව අයවැය පිළියෙල කිරීම සම්බන්ධව ඇති වූ නව ප්‍රවේශයක් වන අතර එමගින් වියදම් වඩාත් අර්ථාන්විතව හා ඵලදායිව සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

*ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

*2009 පෙබරවාරි 04*

වෙබ් අඩවිය
www.nbd.gov.lk

